දරුවා! ඔබ අල්ලාහ්ගේ නාමය පවසන්න. ඔබේ දකුණතින් අනුභව කරන්න. ඔබට අසළින් ඇති දෑ අනුභව කරන්න

උමර් ඉබ්නු අබී සලමා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: "මම අල්ලාහ්ගේ දූතයාණන්ගේ උකුලේ වැඩුණු කොලුුවෙක් වූයෙමි. මාගේ අත බන්දේසිය වටේ සැරිසරමින් තිබිණ. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මට “දරුවා! ඔබ අල්ලාහ්ගේ නාමය පවසන්න. ඔබේ දකුණතින් අනුභව කරන්න. ඔබට අසළින් ඇති දෑ අනුභව
කරන්න.” යැයි පැවසූහ. ඉන්පසු මගේ ආහාර වේල එසේම විය. [صحيح] [متفق عليه]

උමර් ඉබ්නු අබූ සලමා (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ දන්වා සිටියි. හෙතෙම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ බිරියකගේ පුතෙකු විය. -හෙතෙම නබි තුමාණන් යටතේ හැඳී වැඩින.- ආහාර ගන්නා අතරවාරයේ තම අත කෑම අහුලන්නට බන්දේසිය වටා දෝලනය වෙමින් තිබිණ. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ආහාර ගන්නා විනය සම්බන්ධයෙන් වූ විනය කරුණු තුනක් ඔහුට ඉගැන්වූහ. එවායින් පළමුවැන්න: ආහාර ගැනීම ආරම්භයේ දීම 'බිස්මිල්ලාහ්' යැයි පැවසීමය. දෙවැන්න: දකුණු අතින් ආහාර ගැනීම. තුන්වැන්න: තමන් අසළ, සමීපයෙන් ඇති ආහාරය අනුභව කිරීම.

https://sunnah.global/hadeeth/si/show/58120